## වී අලෙවි මණ්ඩලය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති, වී අලෙවි මණ්ඩලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 1.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

අංක පීඊඩී 12 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සෑම මුදල් වර්ෂයක් සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, 2010 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාස 08 ට පමණ පසු 2011 ඔක්තෝබර් 27 දිනදීය.

### 1.2.2 ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත (ශ්‍රී.ල.ගි.ප්‍ර) වලට අනුකූල නොවීම

පහත සඳහන් ගිණුම් ප්‍රමිත අනුගමනය කර නොතිබුණි.

(අ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 16 පරිදි පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම් කර නොතිබුණි.

(ආ) (i) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 18 පරිදි ඉඩම් හා ගොඩනැගිලි වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවද, පිරිවැය රු.290,664,124 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි එක් ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එම පිරිවැය මත වර්ෂයකට 2.5% බැගින් ක්ෂය ප්‍රතිපාදනද කර තිබුණි.

(ii) වටිනාකම සම්පූර්ණයෙන්ම ක්ෂය කර හා පාවිච්චියෙන් ඉවත් කර තිබුණු රු.24,513,343 ක් වූ ස්ථාවර වත්කම් පොත්වලින් කපා හැරීමට හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේදී වෙනදේසියේ අලෙවිකර තිබුණු ගර්හිත කළ මෝටර් රථ 03 ක පිරිවැය වටිනාකම වෙනුවට රු.1,725,000 ක් වූ තක්සේරු වටිනාකම මෝටර් රථ ගිණුමට බැර කර තිබීම සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි.

(ආ) පිරිවැය රු.22,305,694 ක් වූ යන්ත්‍ර හා උපකරණ සහ වෙනත් උපකරණ වී අලෙවි මණ්ඩලය යළි සක්‍රීය කරන ලද 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම ක්ෂය කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරයෙන් ලැබුණු මෝටර් රථ, කාර්යාල උපකරණ, පරිගණක හා පරිගණක උපාංග, ලී බඩු උපකරණ, වෙනත් උපකරණ හා තෙතමාපක යනාදී ස්ථාවර වත්කම්වල රු.19,770,605 ක් වූ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සහල් මෝල් හිමියන් සමග එළඹුණු සහල් නිෂ්පාදන ගිවිසුම් අනුව, සහල් නිෂ්පාදනය කර භාර දීම සඳහා පෞද්ගලික සහල් මෝල් හිමියන් වෙත නිකුත් කළ වී තොගයෙන්, 2010 දෙසැම්බර් 31 දින වනවිට භාර දිය යුතු හා එදිනට කාලය ඉකුත් වූ රු.28,767,075 ක් වූ සහල් තොග, ණයගැතියන් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට, එම සහල් නිෂ්පාදනය සඳහා නිකුත් කළ වී තොගයේ වටිනාකම මාර්ගස්ථ වී තොග ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) 2010 දෙසැම්බර් 31 දිනට රු.526,751,777 ක් වූ ණයගැති ශේෂ මත ප්‍රමාණවත් බොල් හා අඩමාන ණය වෙන් කිරීම් කර නොතිබණි.

### 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 කට වැඩි කාලපරිච්ජේදයක් තුළ සමුච්චිත වී තිබුණු රු.3,020,249 ක් වූ නිරවුල් නොකළ ලැබිය යුතු රැඳවුම් බදු (WHT) ශේෂ පැවතුණි.

(ආ) සමූපකාර තොග වෙළඳ සංස්ථාවට හා ආහාර දෙපාර්තමේන්තුවට අලෙවි කළ සහල් සඳහා ලැබිය යුතු, පිළිවෙලින් රු.72,566,049 ක් හා රු.10,591,838 ක් වශයෙන් එකතුව රු.83,157,887 ක් හිඟ හිට වර්ෂ 1 සිට 2 කට වැඩි කාලයක් ඉකුත් වී තිබුණද, අයකර ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ යල කන්නයේදී මිලදීගත් වී තොග ප්‍රවාහනය සඳහා සමූපකාර තොග වෙළඳ සංස්ථාවට, ලංකා සතොස සමාගමට හා සමූපකාර සංවර්ධන කොමසාරිස්වරයාට ගෙවා තිබුණු එකතුව රු.20,000,000 ක් වූ අත්තිකාරම් මුදල් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට වැයකර තිබුණද, අත්තකරම් පියවා වියදමට ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ යල කන්නයේ වී මිලදී ගැනීමේ කටයුතු වෙනුවෙන් කම්කරු කුලී, සේවක දීමනා හා වෙනත් වියදම් සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ගෙවා තිබුණු එකතුව රු.795,578 ක් වූ අත්තිකාරම් මුදල් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට වැය කර තිබුණද, අත්තිකාරම් පියවා වියදමට ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) මණ්ඩලයේ නිල නිවාසයක්, සංචාරක නිවාසයක් හා ගබඩා ගොඩනැගිලි 03 ක් අළුත්වැඩියාව සඳහා සමූපකාර තොග වෙළඳ සංස්ථාවට, ගොවිජන සංවර්ධන කොමසාරිස්වරයාට, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට හා මණ්ඩලයේ කලාප කළමනාකාරවරයෙකුට පිළිවෙලින් රු.1,199,045 ක්, රු.1,384,000 ක් රු.294,232 ක් හා රු.360,450 ක් වශයෙන් ගෙවා තිබුණු එකතුව රු.3,237,727 ක් වූ අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් වැය කර තිබුණද, අත්තිකාරම් පියවා වියදමට ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ "C" කලාපයේ නිලධාරීන් විසින් සමාලෝචිත වර්ෂයේ මහ කන්නයේ මිලදී ගත් වී තොගය රු.103,381,776 ක් වුවද, මණ්ඩලයට භාර දී තිබුණේ රු.102,946,494 ක් වූ වී තොග පමණකි. ඒ අනුව, රු.435,292 ක් වූ තොග ඌනතා අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබණි.

(උ) මණ්ඩලයට අයත් ගබඩා, වී මෝල් සංකීර්ණ, කාර්යාල හා නිල නිවාස යනාදී ගොඩනැගිලි 44 ක් වර්ෂ 5 කට වැඩි කාලයක් තිස්සේ බාහිර පාර්ශ්වයන් විසින් පාවිච්චි කෙරෙන අතර ඒ සඳහා කුලී අයකර ගෙන නොතිබුණි. බදු දී තිබුණු තවත් ගොඩනැගිලි 19 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 උන වන විට අයවියයුතු කුලී රු.5,143,995 ක් විය.

(ඌ) වර්ෂ 05 කට වැඩි කාලපරිච්ඡේදයක් නිරවුල් නොවී ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පවතින පහත දැක්වෙන ගිණුම් ශේෂයන් අයකරගෙන හෝ නිරවුල් කර ගිණුම් ගැලපීමට කටයුතු නොකර, ආර්ථික නොවූ වත්කම් හා වගකීම් ලෙස දක්වා තිබුණි.

| ගිණුම් විස්තරය | ගිණුම් සංඛ්‍යාව | වටිනාකම රු. | ගිණුම්වල දැක්වීම |
|---|---|---|---|
| වී, සහල්, කෘෂි භෝග හා වෙනත් නිෂ්පාදන අලෙවි ආදායම් | 91 | 477,432,325 | ආර්ථික නොවූ ජංගම වත්කම් |
| කෙරගෙන යන වැඩ, මාර්ගස්ථ තොග, ත්‍රස්තවාදීන් පැහැරගත් වත්කම්, අවිනශ්චිත ගිණුම්, යන්ත්‍රෝපකරණ අමතර කොටස්, ගනී බෑග්ස් | 08 | 96,263,846 | |
| ලැබිය යුතු මුදල් | 37 | 52,609,373 | |
| සේවක ණය හා අත්තිකාරම් | 08 | 1,502,567 | |
| මුදල් ශේෂ | 09 | 1,265,670 | |
| | 153 | 629,073,781 | |
| තැන්පත් ගිණුම - වී විකුණුම්, ආරක්ෂිත, ටෙන්ඩර්, අනෙකුත් තැන්පතු හා රඳවා ගැනීම් | 07 | 26,743,691 | ආර්ථික නොවූ ජංගම වගකීම් |
| ගෙවිය යුතු වියදම් හා පූර්ව ලැබීම් | 78 | 217,338,006 | |
| පාලන ගිණුම් | 24 | 20,272,183 | |
| ආපසු ගෙවිය යුතු ණය හා අත්තිකාරම් | 04 | 1,853,765,967 | |
| | 113 | 2,118,119,847 | |

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.121,217,381 ක් වූ ස්ථාවර වත්කම්, එකතුව රු.5,493,096,671 ක් වූ වී, සෝයා බෝංචි, පොලිසැක් මළු තොග, එකතුව රු.132,566,434 ක් වූ මාර්ගස්ථ තොග, එකතුව රු.83,157,887 ක් වූ සහල් විකුණුම් ණයගැතියෝ, එකතුව රු.5,677,359,875 ක් වූ ණය, එකතුව රු.2,118,205,195 ක් වූ අභාවිත වගකීම්, එකතුව රු.632,112,315 ක් වූ අභාවිත වත්කම්, එකතුව රු.226,607,067 ක් වූ අරමුදල් යනාදී ගිණුම් ශේෂවලට අනුරූපී ස්ථාවර වත්කම් ලේඛන, හිමිකම් ඔප්පු, තොග ලේඛන, තොග සමීක්ෂණ වාර්තා, ණයගැති / ණයහිමි ලේඛන, ශේෂ සනාථ කිරීම්, ණයලේඛන, මාර්ගස්ථ තොග සනාථ කිරීමේ ලියවිලි, විස්තරාත්මක උපලේඛන, තහවුර කර ගැනීමේ ලේඛන, ලිපිගොනු , පැවැත්ම තහවුරු කර ගැනීමට අදාල තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එම විෂයයන් සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

අදාල ලිපිලේඛන නොමැති බැවින්, කමිටුවක් පත් කර එමගින් ලබා දෙන තීරණ මත ඉදිරි කටයුතු කිරීමට නියමිත බව සභාපතිවරයා මා වෙත දැනුම් දෙන ලදී.

### 1.2.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 134 (3) | අභ්‍යන්තර විගණනයක් සිදු කර එම වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 387 | අනුමැතියකින් තොරව බැංකු අයිරා පහසුකම් ලබාගෙන තිබුණි. |
| (ආ) 2007 ජූලි 25 දිනැති අංක07/1199/315/31 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරිය ඈවර කර අධිකාරිය සතු සියළුම වත්කම් හා බැරකම් මණ්ඩලය වෙත පවරා ගත යුතු වුවත්, රු.184,658,970 ක් වූ ස්ථාවර තැන්පතු, ඉතිරි කිරීමේ තැන්පතු, අතැති මුදල් ශේෂ, සේවක අත්තිකාරම් යනාදී වත්කම් පමණක් පවරා ගෙන තිබූ අතර, අනෙකුත් වත්කම් හා වගකීම් පවරා ගැනීමට හා අධිකාරියේ ඈවර කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් පියවර ගෙන නොතිබුණි. |

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) 6.5.1 ජේදය — කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 7 ජේදය — විගණන කමිටුව පත් කර නොතිබුණි.

(ඈ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඊඅයි/2002/02 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 756 — එකතුව රු.121,217,381 ක් වූ ස්ථාවර වත්කම් හා එකතුව රු.5,626,491,938 ක් වූ තොග වර්ෂ 5 කට වැඩි කාලපරිච්ජේදයක් සමීක්ෂණය කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් අලාභය රු.346,747,034 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ලාභය රු.150,717,260 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.497,464,294 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණ. වෙනත් ආදායම් රු.32,303,702 කින් වැඩි වුවද, මෙහෙයුම් දළ ලාභය රු.243,037,208 කින්ද, මෙහෙයුම් වියදම් රු.286,730,788 කින්ද වැඩිවීම එම පිරිහීමට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ විවිධ අදියරයන් පහත දැක්වේ.

| | | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | |
|---|---|---|---|
| | | 2010 | 2009 |
| | | රු. | රු. |
| (i) | මෙහෙයුම් දළ ලාභය | 20,814,460 | 263,851,668 |
| (ii) | බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය / (පාඩුව) | (346,747,034) | 150,717,260 |
| (iii) | වර්ෂයේ ශුද්ධ ලාභය / (පාඩුව) | (346,747,034) | 150,717,260 |

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

### කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ක්‍රියාකාර සැලැස්මට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 8,120 ක් වැය කර වී මෙට්‍රික් ටොන් 280,000 ක් මිලදී ගැනීම සඳහා ඇස්තමේන්තුගත කර තිබුණද, රු. මිලියන 5,339 ක් වැයකර වී මෙට්‍රික් ටොන් 188,101 ක් පමණක් මිලදී ගෙන තිබුණි. එය ඉලක්කගත ප්‍රමාණයෙන් 67% ක් විය. ඉකුත් වර්ෂය සමඟ සසඳන කල 49% ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

(ආ) 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනතේ 3 සහ 10 වගන්ති අනුව, වී සහ සහල් කෙටීමේ, පැහමේ හා සකස් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම හා පෞද්ගලික වී මෝල් ලියාපදිංචි කිරීම කටයුතු ක්‍රියාත්මක කළ යුතුව තිබුණද, එම කටයුතු ඉටු කර නොතිබුණි.

## 2.3 හඳුනාගත් පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වී මිලදී ගැනුම්වල වටිනාකම බැංකු ජංගම ගිණුම් වලින් කළ ගෙවීම් අනුව රු.5,410,611,685 ක් වූ අතර, ගබඩා තොග ශේෂ වාර්තා අනුව රු.5,361,024,536 ක් විය. මේ අනුව රු.49,587,149 ක් වූ වී තොග ඌනතාවයක් නිරීක්ෂණය වූ අතර, වී මිලදී ගැණම් පාලන ගිණුමේ දැක්වුණු එම තොග ඌනතාවය ජංගම වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම තොග ඌනතාවය වංචාවක් නොවීය යන්න බැහැර කළ නොහැකි විය.

(ආ) මණ්ඩලය සතු වත්කම් පැහැරගෙන යාම නිසා රු.80,226,713 ක අලාභයක් වර්ෂ 5 කට පමණ පෙර සිදු වී තිබුණි. මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් මේ දක්වා ගෙන නොතිබුණි.

(ඇ) තොග ඌණතා රු.97,164,100 ක් හා තොග ගැලපුම් රු.2,279,071 ක් වශයෙන් එකතුව රු.99,443,171 ක් වූ ශේෂ වර්ෂ 5 කට වැඩි කාලයක් පුරා පවත්වා ගෙන ගොස් තිබුණි.

(ඈ) එකතුව රු.405,050 ක් වූ බැංකු ගත නොකළ ලැබීම් වර්ෂ 05 කට වැඩි කාලපරිච්ඡේදයක් පැවතුණි.

(ඉ) බැංකු අයිරා පොලී ලෙස රු.61,826,718 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

## 2.4 අයවැය පාලනය

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක පීඊඩී/12 හා 2003 ජූනි 02 දිනැති චක්‍රලේඛයේ 5.2.1 ඡේදය පරිදි ආදායම් ඇස්තමේන්තු සහ ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය දැක්වෙන ලෙස අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි. අයවැය ලේඛනයේ වියදම් වර්ගීකරණයද මූල්‍ය ප්‍රකාශනවල වර්ගීකරණයට අනුරූපී නොවූ නිසා ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම් අතර වූ විචලනයන් ගණනය කල නොහැකි හෙයින්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන ඇති බව තහවුරු කළ නොහැකි විය.

## 3. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර මණ්ඩලයේ සභාපතිවරයා දැනුවත් කරන ලදී.පහත සඳහන් පාලන ක්ෂේතයන් පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) පොත්පත්, වාර්තා හා උපයෝගී ලේඛන පවත්වාගෙන යාම
(ඇ) දේපලවල හිමිකම පවරා ගැනීම
(ඈ) හඳුනා නොගත් වත්කම්, වගකීම්, ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ
(ඉ) කෘෂි අලෙවි අධිකාරීගෙන් ලද වත්කම් හා වගකීම් පවරා ගැනීම
(ඊ) අභ්‍යන්තර විගණනය
(උ) අයවැය පාලනය
(ඌ) ආර්ථික නොවූ වත්කම් හා වගකීම් ගිණුම් ශේෂ